*සැ. යු.-* 2021.07.22 දින පළ වූ අංක 2,238 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,239 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 486 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 488 |


සැ. යු. - (i) මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) සමාධි භාවනා හා යෝග මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 අගෝස්තු මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මීගමුව දිසා අධිකරණයේ දී ය

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ඇස්කිසි අංකය : 49/2021
නඩු අංකය : MB/3506
ස්වභාවය : උකස්කරය
වටිනාකම : රු. 796,348/80
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී කොළඹ 01, රසික් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇත්තේ ය. තව ද, මීගමුව, ප්‍රනාන්දු මාවතේ අංක 24 - 26 දරන ස්ථානයේ මීගමුව ශාඛාව යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේ ය.

......................*පැමිණිලිකරු.*

*විරුද්ධව*

01. කේ. කැලුම් තුෂාර ප්‍රනාන්දු,
අංක 6/ඒ, මාන්කුලිය පාර, මීගමුව.

..........................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවට අදාළව 2018.07.16 වැනි දිනැතිව පැමිණිල්ලේ වාසියට දී ඇති තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරුගෙන් අයවිය යුතු රු. 796,348.80ක මුදලක් (රුපියල් හත් ලක්ෂ අනූ හය දහස් තුන්සිය හතලිස් අටයි ශත අසූවක්) සහ රු. 630,720 ක් වූ මුදල මත 2012.08.31 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දින තෙක් වාර්ෂිකව 20% අනූ ප්‍රමාණයෙන් පොළියක් රු. 165,628.20ක් වූ මුදල මත තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු නෛතික පොළිය ද නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් දේපල එම ස්ථානයේ දී ම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දිනය : 2021 සැප්තැම්බර් මස 03 දින ප. ව. 2.30 ට.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසි මුදල පහත සඳහන් ආකාරයට ගෙවිය යුතුය :-

01. ගැණුම්කරු විසින් විකුණුම් මුදලින් සියයට විසිපහක් (25%)
02. ඉතිරි 75%ක මුදල දින 30ක් ඇතුලත ගෙවිය යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත, අලුත්කුරු කෝරලයේ දූනගහ පත්තුවේ කඳවල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් - බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 27/1992 හා 1992 මැයි මස 02 වැනි දින දරන පිඹුරේ 3 හා 4 බිම් කැබලිවලින්, නැගෙනහිරින් - පාරෙන් ද, දකුණින් - වීරසිරිගේ බර්නඩෙට් ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් හා, බස්නාහිරින් - එකී පිඹුරේ අංක 2 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, මීගමුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 747/31 වෙලුම්/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, පිහිඹියගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 27/1992 දරන පිඹුරේ නිරූපිත 5 - A හා 5 - B බිම් කැබලි වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

ඉහත විස්තර කර ඇති එකී ඉඩම මෑතක දී කරන ලද නැවත මැනීමක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත, අලුත්කුරු කෝරලයේ දූනගහ පත්තුවේ කඳවල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : ඩබ්ලිව්. එච්. ප්‍රියන්තට අයත් 3 හා 4 බිම් කැබලිවලින්, නැගෙනහිරින් : පාරෙන්, දකුණින් : ඩබ්ලිව්. බර්නඩෙට් ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් හා බස්නාහිරින් : ඩබ්ලිව්. එච්. ඇම්. එඩ්නා ස්වර්ණකාන්තිට අයත් අංක 2 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, අංක 5269 දරන එකී පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි පහකින් (අ. 0, රූ, 0,

පර්. 12.55) යුක්ත වූ ද, පිහිඹියගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද අංක 5269 හා 2009 මාර්තු 26 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

පෙර ලියාපදිංචිය : E 1186/52

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මීගමුව.

වර්ෂ 2021ක් වූ ජූලි මස 09 වැනි දින,
මීගමුව දිසා අධිකරණයේ දී ය.

07-611

---

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

### කැකිරාව දිසා අධිකරණයේ දී ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත,
කොළඹ 01.

*නඩු අංකය* : 16/MB
*ස්වභාවය* : උකස් බැඳුම්කර
*ඇස්කිසි අංකය* :

*................පැමිණිලිකරු.*

*එදිරිව*

01 ආර් එම් මංජු ශ්‍රී රංජිත් අධිකාරි
02. එච්. එම්. කේ. චම්පිකා

*දෙදෙනාම :*

ඉංග්ලිස් ඇකඩමිය අසල, උසාවි පාර,
කැකිරාව.

*................විත්තිකරුවන්.*

වර්ෂ 2018ක් වූ මාර්තු මස 09 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුවන් විසින් වර්ෂ 2018 අප්‍රේල් මස වන විට ගෙවීමට ඇති හිඟ මුදල වන රුපියල් 750,000/- මුදල 2018 අප්‍රේල් මස අවසන් දිනට පෙර ගෙවා නිමකළ යුතු බවටත් ඉන්පසු ඉතිරි මුදල් අප්‍රේල් මසින් පසුව 2018.11.25 දින දක්වා මසකට රු. 150,000/- බැගින් වාරික 12කින් හා ඉන්පසුව එනම් 2018 දෙසැම්බර් මස සිට ඉදිරියට මසකට රු. 200,000 බැගින් වාරික 51කින් ගෙවා නිම කිරීමටත්, එකඟවූව ද එකී සමථය ප්‍රකාර කටයුතු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වූයෙන් සහ විත්තිකරුවන් විසින් මෙතෙක් ගෙවා ඇති මුදල අඩුකර, දැනටමත් මා විසින් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් වන දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර සමාගමට අයකර දීම සඳහා,

වර්ෂ 2021ක් වූ සැප්තැම්බර් 03 වන දින පෙ. ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාමිනියාව කෝරළයේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මරදන්කඩවල පාරේ අංක 627 දරන ස්ථානයේ මාලාව ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ උතුරින් - ඒ. ඇම්. බන්දුලට අයත් ඉඩමෙන්, නැගෙනහිරින් - අජන්තට අයත් ඉඩමෙන්, දකුණින් - මහින්ද ගොඩහේනට අයත් ඉඩමෙන් සහ බස්නාහිරින් - උම්මු සිපාට අයත් ඉඩමෙන් හා පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් තිස් අටකින් (අ. 0, රූ. 0, පර්. 38) යුක්ත වූ ද අංක 864 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කරන ලද මුලු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලුම දේ ද සමග වේ. වඩාත් මෑතක දී කරන ලද මැනීමක් අනුව ඉහත සඳහන් ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය සභා සීමා ඇතුලත කැකිරාව දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ, මාමිනිය කෝරළයේ කුඩා කැකිරාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංක 629 මාලාව ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ උතුරින් ඒ. ඇම්. බන්දුලට අයත් ඉඩමෙන්, නැගෙනහිරින් අජන්තට සහ ඒ. එම්. බණ්ඩාරට අයත් ඉඩමෙන් දකුණින් මහින්ද ගොඩහේනට සහ උම්මු සිමාට අයත් ඉඩමෙන් සහ බස්නාහිරින් උම්මු සිපාට අයත් ඉඩමෙන් හා ජයන්ති මාවතෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම හයකින් (අ. 0 රූ. 0, පර්. 36.6) යුක්ත වූ ද, අංක අනු/කැකි/ප්‍රා/2841 හා 2001/06/06 යන දින දරන රජයේ ප්‍රදානයේ විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු ජේ. ටී. ගලගෙදර විසින් සාදන ලද අංක 1732 හා 2006/09/26 වැනි දින පිඹුරේ අංක 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කළ ඇති බෙදා වෙන් කරන ලද සහ නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද සමග වේ.

*දේපලට පිවිසීම.*- කැකිරාව උසාවි පාරෙන් 1 km ක් පමණ ගොස් දකුණට ඇති ඉංග්‍රිස් ඇකඩමිය පාරෙන් 150 m ක් පමණ ගියපසු වම් පසින් වන්නට ඉංග්‍රිස් ඇකඩමියට යාබදව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 25%, (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1% (3) ප්‍රචාරණ වියදම් (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කැකිරාව දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත. හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානී - නීති සහ අයකිරීම්, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අංක 21, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01.

රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය,
කැකිරාව.

වර්ෂ 2021ක් වූ ජූලි මස 05 දින දී ය.

07-688

---

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගාමිණී වලේබොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53(1) යටතේ ''ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි :-

*(අ)* සැලසුම් තාක්ෂණවේදයේ ශිල්ප ක්‍රම සහ කුසලතා ඇතුළුව එහි දියුණුව ප්‍රවර්ධනය කිරීම සහ සුපෝෂණය කිරීම ;

*(ආ)* සැලසුම් තාක්ෂණවේදය වෘත්තියෙහි ඒකමතිකභාවය ආරක්ෂා කිරීම සහ (මෙහි මින්මතු ''ටීවීඊසී'' යනුවෙන් සඳහන් කරනු ලබන) තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විමසා ශ්‍රී ලංකාවේ සැලසුම් තාක්ෂණවේද අධ්‍යාපනය නවීකරණය, අධීක්ෂණය, උපදේශනය සහ පාලනය කිරීම ;

*(ඇ)* සැලසුම් තාක්ෂණවේදයට අදාළව ටීවීඊසී විසින් ප්‍රතීතනය කරන ලද යම් පාඨමාලා පැවැත්වීම සඳහා ටීවීඊසී විසින් ආයතනයට ලබා දෙන ලද යම් අධිකාරි බලයක් ආයතනය විසින් කිසිදු අවස්ථාවක දී ඉක්මවනු නොලබන පරිදි සැලසුම් තාක්ෂණවේද පාඨමාලා පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

යනාදිය වේ.

ගාමිණී වලේබොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
රත්නපුර දිස්ත්‍රික්කය.

07-691

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.